## 2019 අංක 02 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා ප්‍රතිලාභී හිමිකම හඳුනාගැනීම පිළිබඳ මාර්ගෝපදේශ

### I කොටස

### හැඳින්වීම

1. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 15 (1) (j) වගන්තියට අනුකූලව මෙම මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ. පනත යටතේ පවරා ඇති බලතල අනුව ක්‍රියාකරමින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2018 ජනවාරි 10 වන දින අංක 2053/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින්, පනතෙහි 33 වන වගන්තියේ අර්ථ දක්වන ලද නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන්හි නියැලී සිටින ආයතනවලට, නිකුත් කරන ලද දිනයේ සිට බලාත්මක වන පරිදි, 2018 අංක 01 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීති (මෙහි මින් මතු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති යනුවෙන් සඳහන් කරනු ලබන) නිකුත් කරන ලදී. නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති අංක 43 යටතේ අර්ථ දක්වා ඇති පරිදි නෛතික පුද්ගලයෙකු හෝ නෛතික වැඩපිළිවෙලක අවසාන ප්‍රතිලාභී හිමිකරු වන තැනැත්තා හඳුනා ගැනීම සහ අනන්‍යතාව තහවුරු කරගැනීම පිණිස යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ ප්‍රතිපාදන, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති වල අඩංගු අනෙකුත් කරුණු අතර, අංක 10,13,17,19 යන රීති මගින් ස්ථාපිත කර ඇත.

2. පනත යටතේ අර්ථ දක්වා ඇති පරිදි පහත දැක්වෙන ව්‍යාපාර හා වෘත්තීන් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර ලෙස සලකනු ලැබේ.

a) අන්තර්ජාලය මගින් එවැනි යම් ව්‍යාපාරයක් කරගෙන යන පුද්ගලයකු ද ඇතුළුව කැසිනෝ/සූදු ගෙවල්/ ලොතරැයියක් පවත්වාගෙන යාම.

b) නිශ්චල දේපල මිලට ගැනීම හා විකිණීමට අදාළව, තම ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනුවල යෙදෙන නිශ්චල දේපළ අනුයෝජිතයින්.

c) ලෝහ හා ගල් ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවූ වටිනා ලෝහ වෙළඳුන් සහ මැණික් හා අඩ මැණික් ගල් වෙළඳුන්.

d) නීතීඥයින්, නොතාරිස්වරුන්, වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන්/ ගණකාධිකාරීවරුන්.

e) භාර හෝ සමාගම් සේවා සපයන්නන්.

3. මෙම මාර්ගෝපදේශ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීම, අනන්‍යතාව තහවුරු කරගැනීම සහ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති ක්‍රියාත්මක කිරීම පිණිස සහාය සපයයි. මෙම මාර්ගෝපදේශ සවිස්තරාත්මක නොවන අතර, කිසිදු නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක් කෙරෙහි නීත්‍යානුකූලව බැඳීම් ඇති නොකරන්නා සේම, මූල්‍ය බුද්ධි ඒකකය වෙතින් ලබාදෙන නෛතික උපදේශයක් සංස්ථාපනය කිරීමක්ද නොවේ. තවද, පනත යටතේ හෝ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති යටතේ පවතින අනුකූලතා බැඳීම් කිසිවකින් මූල්‍ය නොවන ව්‍යාපාර නිදහස් කරන්නක් වශයෙන් මෙම මාර්ගෝපදේශ වල අඩංගු කිසිවක් අර්ථකථනය නොකළ යුතුය.

## II කොටස

### අ) ප්‍රතිලාභී හිමිකරු අර්ථ දැක්වීම

4. "ප්‍රතිලාභී හිමිකරු"යන්නෙන් ගනුදෙනුකරුවකුගේ අත්‍යන්ත හිමිකාරීත්වය දරන හෝ ගනුදෙනුකරුගේ පාලනය සහිත ස්වභාවික තැනැත්තකු නැතහොත් ගනුදෙනුව පවත්වනු ලබන්නේ යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා ද, ඒ තැනැත්තා අදහස් වන අතර යම් තැනැත්තකුගේ හෝ නෛතික වැඩපිළිවෙලක සක්‍රිය ලෙස අත්‍යන්ත පාලනය දරනු ලබන තැනත්තකුද ඊට ඇතුළත් වේ.

5. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර, තනි පුද්ගල ගනුදෙනුකරුවන් සමඟ මෙන්ම ආයතනික ගනුදෙනුකරුවන් සමඟ ද ගනුදෙනු සිදු කිරීම හෝ ව්‍යාපාරික සබඳතා ඇති කර ගැනීම සිදු කරයි. ආයතනික ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු කිරීම ස්වභාවික තැනැත්තකු හෝ, "නෛතික පුද්ගලයෙක්" හෝ "නෛතික වැඩපිළිවෙලක්" සමඟ කෙරෙන ඕනෑම ගනුදෙනුවක් විය හැකිය. "නෛතික පුද්ගලයෙක්" යන්නෙහි අර්ථය "මූල්‍ය නොවන ව්‍යාපාරයක් සමග ස්ථිර ගනුදෙනුකාර සම්බන්ධතාවයක් තහවුරු කිරීමට හැකියාව ඇති හෝ අන්‍යාකාරයකින් දේපල අයත් වන යම් ස්වභාවික තැනැත්තකු නොවන අස්ථිත්වයක් අදහස් වන අතර, එයට සමාගමක්, සංස්ථාවක්, පදනමක්, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක් ඇතුලත් වේ". "නෛතික වැඩපිළිවෙලක්" යන්නට "ප්‍රකාශිත භාරයක් [1] , භාරකාර ගිණුමක් හෝ නාමිකයෙක්" ඇතුළත් වේ.

6. අවසාන ප්‍රතිලාභී හිමිකරු හෝ හිමිකරුවන් වන තැනැත්තා/තැනැත්තන් නිශ්චය කිරීම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයෙහි වගකීමකි. අවසාන ප්‍රතිලාභී හිමිකරු අනිවාර්යයෙන්ම ස්වාභාවික තැනැත්තකු විය යුතු අතර සමාගමක්, සංවිධානයක් හෝ නීතිමය වැඩපිළිවලක් විය නොහැක. ගනුදෙනුකරුවෙකු සමඟ සම්බන්ධිත ප්‍රතිලාභී හිමිකරුවන් කිහිප දෙනෙකු සිටිය හැක.

7. ගනුදෙනුකරු ස්වභාවික තැනැත්තෙක් වන්නේ නම්, ඔහු වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් ඉදිරිපත් වන බවට හෝ ගනුදෙනුකරුගේ දේපල සම්බන්ධ ප්‍රතිලාභී හිමිකරු වෙනයම් තැනැත්තකු වන බවට පෙන්නුම් කිරීමට තරම් සාධාරණ පදනමක් නොපවතින්නේ නම්, එකී තැනැත්තා ප්‍රතිලාභී හිමිකරු ලෙස සැලකිය හැකිය. ගනුදෙනුකරු වෙනත් පුද්ගලයෙකු වෙනුවෙන් ක්‍රියා කරන්නේ නම්, එම පුද්ගලයා ප්‍රතිලාභී හිමිකරු නොවිය හැකිය.

### ආ) ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීම වැදගත් වන්නේ ඇයි?

8. සමාගම්, භාර, පදනම්, හවුල් ව්‍යාපාර වැනි සංස්ථාපිත ආයතන සහ වෙනත් ආකාරයේ නෛතික පුද්ගලයන් සහ වැඩපිළිවෙලවල් විවිධාකාර වාණිජ හා ව්‍යවසායක ක්‍රියාකාරකම් සිදු කරයි. කෙසේ වුවත්, සංස්ථාපිත ආයතන ආර්ථිකය තුළ ඉතා වැදගත් හා නිත්‍යානුකූල භූමිකාවක් ඉටු කළද යම් යම් තත්වයන් යටතේ, එම ආයතන, මුදල් විශුද්ධිකරණය[2], අල්ලස් හා දූෂණය, අභ්‍යන්තර වෙළඳාම, බදු වංචා, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම[3] සහ වෙනත් නීති විරෝධී ක්‍රියාකාරකම් ඇතුළු අයථා අරමුණු සඳහා අවභාවිත කර ඇත. මෙයට හේතුව,

---

[1] 1917 අංක 7 දරන භාර ආඥාපනතෙ හි 3 වන වගන්තිය, 2018 අංක 6 දරන භාර (සංශෝධන) පනතෙහි ("භාර සංශෝධන පනත") 2 වන වගන්තියෙන් සංශෝධනය වූ පරිදි, 'ප්‍රකාශිත භාරයක්' යන්නෙන් භාරයේ කතෘ විසින් භාරයේ අරමුණ නිශ්චිතව දක්වමින්, සාමාන්‍යයෙන් ලිඛිත වූ සාධන පත්‍රයක් මගින් ඇති කරනු ලබන භාරයක් අදහස් වන අතර, එහෙත් ඊට අනුමිත භාරයක් හෝ තත්වාකාර භාරයක් ඇතුළත් නොවේ.

[2] මුදල් විශුද්ධිකරණය යනු 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ පනතෙහි 3 වන වගන්තියේ සඳහන් කර ඇති මුදල් විශුද්ධිකරණ වරදක් වේ.

[3] ත්‍රස්තවාදයට මුදල් සැපයීම යනු 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතෙහි 3 වන වගන්තිය ප්‍රකාර වරදක් සංස්ථාපනය කෙරෙන අදහස් වේ.

මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් වූ නිර්දේශයන් මගහැරීමට උත්සාහ කරන අපරාධකරුවන්ගේ හිමිකාරිත්වය සහ අයථා මුලාශ්‍ර සැඟවීම කෙරෙහි සංස්ථාපිත ආයතන ආකර්ශනීය මාර්ගයක් සපයන බැවිනි.

9. මූල්‍ය කාර්ය සාධක බලකාය, ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය විසින් කරන ලද විවිධ අධ්‍යයනයන් මගින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු අයථා අරමුණු සඳහා සංස්ථාපිත ආයතන අවභාවිත කිරීම පිළිබඳව හඳුනාගෙන ඇත. පොදුවේ ගත් කල, ප්‍රතිලාභී හිමිකාරීත්ව පිළිබද ප්‍රමාණවත්, නිවැරදි හා කාලෝචිත තොරතුරු හිඟතාවය හේතුවෙන්:

අ) අපරාධකරුවෙකු ලෙස හඳුනා ගත් හෝ අපරාධකරුවෙකු ලෙස සැක කටයුතු පුද්ගලයකුගේ අනන්‍යතාවය,

ආ) සංස්ථාපිත ආයතනයක් විසින් සිදු කරනු ලබන ගනුදෙනුවක සැබෑ අරමුණ සහ/හෝ

ඇ) සංස්ථාපිත ආයතනයක් හා සම්බන්ධ අරමුදල්වල මූලාශ්‍රය හෝ භාවිතය

ආදිය වසන් කිරීම තුළින් මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා පහසුකම් සපයයි.

## III කොටස

## ප්‍රතිලාභී හිමිකරු සනාථ කර ගැනීම

### අ) ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ කා වෙනුවෙන්ද?

10. ප්‍රතිලාභී හිමිකාරිත්වය නිර්වචනයේ ඇති එක අංගයක් වන්නේ යම් පුද්ගලයෙක් ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ කා වෙනුවෙන්ද යන්නයි. මෙම තැනැත්තා ගනුදෙනුකරුගේ සේවාදායකයා වුවද විය හැකිය. උදාහරණයක් ලෙස, 'B' පුද්ගලයා වෙනුවෙන් 'A' පුද්ගලයා කලින් කල ගනුදෙනුවක් සිදු කරන බව නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය දනී නම්, ගනුදෙනුවේ පාර්ශවකරුවෙකු වන 'A' පුද්ගලයා සහ 'B' පුද්ගලයා ඇතුළු වෙනත් ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනාගෙන අනන්‍යතාව තහවුරු කළ යුතුය.

11. ගනුදෙනුකරු වෙනුවෙන් ගනුදෙනු හෝ ගනුදෙනුකරු වෙනුවෙන් වෙනත් ක්‍රියාකාරකම් සිදු කිරීමට පුද්ගලයෙකුට අධිකාරිය ලබා දී ඇති විට ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කරන්නේයැයි අදහස් කෙරේ. කෙසේ වෙතත්, ක්‍රියා කිරීමට ඇති අධිකාරියී සඵලදායී පාලනයී සමග වරදවා වටහා නොගත යුතුය. ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් වෙනත් පුද්ගලයන් ක්‍රියා කරන විටද එම පුද්ගලයා අත්‍යවශ්‍යයෙන් ම එම ගනුදෙනුකරුගේ ප්‍රතිලාභී හිමිකරුවන් නොවන අවස්ථා ද පැවතිය හැක.

12. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් විසින් ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කරන ස්වභාවික තැනැත්තන් හඳුනාගෙන එවැනි පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත යුතුය[4] . ගනුදෙනුකරු වෙනුවෙන් ක්‍රියා කිරීමට එවැනි පුද්ගලයකුට ඇති අධිකාරිය, එසේ අධිකාරිය පවරා දුන් පුද්ගලයින්ගේ නිදර්ශක අත්සන් ඇතුළු ලේඛනමය සාක්ෂි මගින් තහවුරු කර ගත යුතුය.

### ආ) නෛතික පුද්ගලයින්ගේ ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා ගැනීමේ මූලිකාංග

13. නෛතික පුද්ගලයෙකුගේ ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලියේ දී සලකනු ලබන ප්‍රධාන මූලිකාංග පහත දැක්වේ.

I. නෛතික පුද්ගලයාගේ හිමිකාරිත්වයෙන් සියයට දහයකට (10%) වඩා හිමි හෝ පාලනය කරන ස්වභාවික තැනැත්තා/තැනැත්තන් කවුරුන්ද? (පාලන හිමිකාරිත්වය)

[4] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන්හි 11 වන රීතියට යොමු වන්න.

II. නෛතික පුද්ගලයාගේ "සඵලදායී පාලනය" කුමන ස්වභාවික තැනැත්තා/තැනැත්තන් සතුව පවතී ද? (සඵලදායී පාලනය)


III. ගනුදෙනුව සිදු කරනු ලබන්නේ කුමන ස්වභාවික තැනැත්තා/තැනැත්තන් වෙනුවෙන්ද? (ගනුදෙනුවක් සිදු කරනු ලබන්නේ කා වෙනුවෙන්ද)

**මූලිකාංග I - පාලන හිමිකාරීත්වය**

14. නෛතික පුද්ගලයන් වන ගනුදෙනුකරුවන්ගේ හිමිකාරීත්වය සහ පාලන ව්‍යුහය, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් විසින් අවබෝධ කර ගත යුතුය[5]. අත්‍යන්ත පාලන හිමිකාරීත්වය අර්ථ දැක්වෙන්නේ "නෛතික පුද්ගලයෙකුගේ ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වඩා සෘජුවම හෝ වක්‍රව හිමිකාරීත්වයක්" ලෙසය. ඒ අනුව, මෙම මූලිකාංග යටතේ, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් විසින් නෛතික පුද්ගලයාගේ කොටස් හිමිකාරීත්වයෙන් 10% කට වඩා වැඩි කොටස්හිමි කොටස් හිමියන්, ප්‍රතිලාභී හිමිකරුවන් ලෙස හඳුනා ගැනීමට අවශ්‍ය වේ. නෛතික පුද්ගලයෙකු වන ගනුදෙනුකරුගේ 10% වඩා වැඩි හිමිකාරීත්වයක් පැවතීම, පාලන බැදියාව සඳහා නියමිත සීමාව ලෙස අර්ථ නිරූපණය කරනු ලැබේ[6]. පහත රූපසටහනේ දක්වා ඇති පරිදි සමස්ත හිමිකාරීත්වය සෘජු මෙන්ම වක්‍රාකාරව පැවතිය හැකිය.

1 රූප සටහන : සෘජු කොටස් හිමිකාරීත්වය

නෛතික පුද්ගලයකු වන 'A සමාගම' නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක ගනුදෙනුකරුවෙකි. A, B, C, D සහ E යන අය 'A සමාගමේ' සෘජු කොටස් හිමියන් වන අතර B, C සහ D යනු 10% ට වඩා හිමිකාරීත්වය ලබන ප්‍රතිලාභී හිමිකරුවන් වේ.





15. ඊට අමතරව, පහත පරිදි වක්‍ර හිමිකාරීත්ව ව්‍යුහයන් තිබිය හැකිය.

2 රූප සටහන : වක්‍ර කොටස් හිමිකාරීත්වය


[5] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි 17 වන රීතියට යොමු වන්න.
[6] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි 18 (අ) වන රීතියට යොමු වන්න

'A සමාගම' යනු නෛතික පුද්ගලයකු වන අතර, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක ගනුදෙනුකරුවෙකි. A සමාගමේ කොටස් වලින් 100%ක් A මව් සමාගම දරන අතර B, C, D, E, F සහ G යන අය A මව් සමාගමේ කොටස් කරුවන් වේ.





3 රූප සටහන: සෘජු සහ වක්‍ර කොටස් හිමිකාරීත්වය

'B සමාගම' නෛතික පුද්ගලයකු වන අතර නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක ගනුදෙනුකරුවෙකි. B සමාගමේ කොටස් වලින් 95% ක් C සමාගම දරන අතර, ඉතිරි 5% A විසින් දරයි. එමෙන්ම, A විසින් C සමාගමේ 100% කොටස් හිමිකාරීත්වය දරයි.



4 රූප සටහන: විවිධ මට්ටමේ වක්‍ර කොටස් හිමිකාරීත්වය

නෛතික පුද්ගලයකු වන ‘ABC සමාගම’, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක ගනුදෙනුකරුවෙකි. ‘PQR සමාගම’ සහ ‘XYZ සමාගම’ යන දෙකම ‘ABC සමාගම’ හි කොටස් වලින් 50% බැගින් කොටස් හිමිකාරීත්වයක් දරනු ලැබේ. ‘PQR සමාගම’ හි කොටස් පිළිවෙලින් D (10%) ක්ද, ‘LMN සමාගම’ (60%) ක්ද, ‘STR සමාගම’ (5%) ක්ද සහ ‘IOD සමාගම’ (25%) ක්ද වශයෙන් හිමිකාරීත්වය දරනු ලැබේ. කෙසේ වෙතත්, Z යන අය ‘LMN සමාගම’ හි කොටස් වලින් 100% ක් ද, Y යන අය ‘STR සමාගම’ හි කොටස් වලින් 100% ක් ද X යන අය ‘IOD සමාගම’ හි කොටස් වලින් 100% ක් ද දරනු ලබයි. තවද, ‘XYZ සමාගම’ හි 100% කොටස් යන අය සතුව ඇත.




17. නෛතික පුද්ගලයන් වන සමහර ගනුදෙනුකරුවන් ගේ හිමිකාරීත්වය 10% ට වඩා අඩු අයිතියක් ඇති තැනැත්තන් විශාල සංඛ්‍යාවක් අතර බෙදී තිබිය හැක.එවැනි අවස්ථාවකදී, කිසිම පුද්ගලයෙකු සතුව සියයට දහයකට වඩා (10%) වැඩි හිමිකාරීත්වයක් නොමැති බැවින්, පහත දැක්වෙන සඵලදායී පාලනය යන මූලිකාංගය ප්‍රතිලාභී හිමිකරු තීරණය කිරීම සඳහා වඩාත් යෝග්‍ය වේ.

මූලිකාංග II: සඵලදායී පාලනය

18. සඵලදායී පාලනය යනු නෛතික පුද්ගලයෙකුගේ ප්‍රතිලාභී හිමිකම තීරණය කිරීමේලා වැදගත් වන තවත් එක අංගයකි. සඵලදායී පාලනය ඍජු හෝ වක්‍ර මෙන්ම විධිමත් හෝ අවිධිමත් විය හැකිය. ඍජු හා විධිමත් අවස්ථාවකදී, නෛතික පුද්ගලයා කෙරෙහි පවතින සඵලදායී පාලනය ක්‍රියාත්මක කරනු ලබන ස්වභාවික තැනැත්තා හඳුනා ගැනීම සඳහා එම නෛතික පුද්ගලයාගේ පාලන ව්‍යුහය අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. නෛතික පුද්ගලයෙකු වන ගනුදෙනුකරුවෙකු සම්බන්ධයෙන් සඵලදායී පාලකයා/පාලකයන් තීරණය කිරීමේදී, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් පහත සඳහන් දේ සලකා බැලිය යුතුය,

(අ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සාමාජිකයෙකු බඳවා ගැනීමට හෝ සේවයෙන් පහ කිරීමට හැකියාව ඇති ස්වභාවික තැනැත්තකු;

(ආ) අධ්‍යක්ෂවරුන් පත් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට හැකියාව ඇති ස්වභාවික තැනැත්තකු;

(ඇ) නෛතික පුද්ගලයාගේ/වැඩපිළිවෙලෙහි දෛනික හෝ නිත්‍ය මෙහෙයුම් සම්බන්ධයෙන් පාලන අයිතිය සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරුවන් (උදා: ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී හෝ කළමනාකාර අධ්‍යක්ෂ).

19. ස්වභාවික තැනැත්තන් විසින් නෛතික පුද්ගලයන් පහත ආකාරයටද පාලනය කරනු ලැබිය හැක.


(අ) විධායක අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරියෙකු / කළමනාකාර අධ්‍යක්ෂ වැනි තනතුරු දරන පුද්ගලයන් හෝ නෛතික පුද්ගලයාගේ හිමිකාරීත්වය දරන පුද්ගලයන් සමඟ පවතින පුද්ගලික සම්බන්ධතා;

ආ) නෛතික පුද්ගලයාගේ මූල්‍ය සම්බන්ධතා කෙරෙහි පවතින සැලකිය යුතු අධිකාරිත්වය (නෛතික පුද්ගලයා වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යන මූල්‍ය ආයතන ද ඇතුළුව) සහ නෛතික පුද්ගලයාගේ පවත්වාගෙන යනු ලබන මූල්‍යමය සම්බන්ධතා පිළිබඳ පවතින සැලකිය යුතු අධිකාරිත්වය;

ඇ) ආයතනයේ මූල්‍යකරණ කටයුතුවලට සම්බන්ධ වීම මගින් හෝ සමීප පවුල් සබඳතා, කලක් තිස්සේ පැවතගෙන එන හෝ ගිවිසුම්ගත සම්බන්ධතා හේතුවෙන් හිමිකාරීත්වයක් නොමැතිව වුවද පාලනය කිරීම;

(ඈ) පාලනය කිසි විටෙකත් ක්‍රියාත්මක නොකළද, නෛතික පුද්ගලයෙකු සතු වත්කම් භාවිතා කිරීම, භුක්ති විඳීම හෝ ප්‍රතිලාභ ලබා ගැනීම.

5 රූප සටහන: සඵලදායී පාලනය




නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයක ගනුදෙනුකරුවකු වන A සමාගම යන නෛතික පුද්ගලයාගේ ප්‍රධාන මූල්‍ය ප්‍රභවය වන ABC බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂවරයා G යන අයයි. එවැනි අවස්ථාවකදී G යන අය විසින් සමාගමේ හිමිකාරීත්වයෙන් සියයට දහයකට වඩා (10%) අඩු කොටස් හිමිකාරීත්වයක් දැරුවද, ABC බැංකුව හරහා 'A සමාගම' වෙත සඵලදායී පාලනයක් ඔහු සතු වේ. තවද, මෙවැනි අවස්ථාවකදී, G යන අය සඵලදායී පාලනයක් තුළින් A සමාගමෙහි ප්‍රතිලාභී හිමිකරුවෙකු ලෙස සැලකිය යුතුය.

20. ඉහත (13-17) යටතේ කිසිදු ස්වාභාවික තැනැත්තකු හඳුනා නොගත් විට, ජ්‍යෙෂ්ඨ කළමනාකාර නිලධාරී තනතුරු දරන ස්වභාවික තැනැත්තන් හඳුනාගැනීමට සහ ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම පිණිස නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් විසින් සාධාරණ පියවර ගත යුතුය.

**ඇ) නෛතික වැඩපිළිවෙලයන්හි ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීම**

21. නෛතික හිමිකාරීත්වය සහ ප්‍රතිලාභී හිමිකාරීත්වය වෙන් වෙන්ව පැවතීම සෑම භාරයකටම පොදු ලක්ෂණයක් වේ. නෛතික හිමිකාරීත්වය සැමවිටම භාරකරු සතු වේ. ප්‍රතිලාභී හිමිකාරීත්වය භාර කතෘන්, භාරකරුවන් හෝ ප්‍රතිලාභීන් විසින් තනි තනිව හෝ සාමුහිකව දරනු ලැබිය හැකිය.

22. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් (පාලන දාමය හෝ හිමිකම හරහා පාලනය කරන අයද ඇතුළුව) භාර කතෘන් ගේ, භාරකරුවන්ගේ, ප්‍රතිලාභියා හෝ ප්‍රතිලාභීන්ගේ සහ භාරය කෙරෙහි සඵලදායී පාලනයක් කල හැකි අනෙකුත් ඕනෑම ස්වභාවික තැනැත්තකුගේ අනන්‍යතාවය ඇතුළුව භාරයකට අදාළ තොරතුරු හදුනාගැනීමට සහ එම තොරතුරු තහවුරු කර ගැනීමට සාධාරණ පියවර ගතයුතු වේ[7] .

23. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් භාර ලියකියවිලි (භාර ඔප්පුව, භාර ලේඛන, භාර ප්‍රකාශය) ලබා ගත යුතු අතර එම භාර ලේඛනයේ ප්‍රතිපාදනයන්ට අදාළ පාලන බල ප්‍රදේශයේ නෛතික රාමුව තුළ සම්පුර්ණයෙන්ම වටහා ගත යුතුය. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් අදාළ ලේඛනය ස්වාධීනව තහවුරු කරගැනීමට සාධාරණ පියවර ගත යුතු වේ. (උදා: භාර ලියාපදිංචිය, නොතාරිස්).

## IV කොටස

## ප්‍රතිලාභ හිමිකාරීත්වය පිළිබඳ තොරතුරු සැඟවිය හැකි ක්‍රම

24. ප්‍රතිලාභී හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු පහත ආකාරද ඇතුළුව විවිධ ආකාර මගින් සඟවා තැබිය හැකිය.

අ) ෂෙල් සමාගම්[8] භාවිතා කිරීම (විවිධ ආකාරයේ හිමිකාරිත්ව ව්‍යුහයන් සමග ස්ථාපිත කළ හැකි). විශේෂයෙන්ම ෂෙල් සමාගම් විදේශීය හිමිකාරිත්වයට සම්බන්ධ නම්, එහි බලපෑම ගෝලීය වශයෙන් වුවද ව්‍යාප්ත විය හැක.

ආ) සංකීර්ණ හිමිකාරීත්ව සහ පාලන ව්‍යුහයන් විවිධ හිමිකාරීත්ව මට්ටම් වලින් සමන්විත වේ. ඇතැම් අවස්ථාවන්හිදී එය පුද්ගලයෙකුගේ නමින් පැවතිය හැකි අතර තවත් විටකදී එය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ හිමිකාරීත්ව දාමයක් ලෙසද පැවතිය හැකිය.

ඇ) කිසිදු සම්බන්ධතාවයක් සොයාගත නොහැකි තෙවන පාර්ශවයන්ගේ නම් යටතේ දේපළ මිලදී ගැනීම,

ඈ) නෛතික පුද්ගලයින් අධ්‍යක්ෂවරුන් ලෙස යොදා ගැනීම,

(ඉ) විධිමත් නාමික කොටස් හිමියන්[9] සහ අධ්‍යක්ෂවරුන් එම කොටස් හිමියන් හෝ අධයක්ෂවරුන්ව නම් කරන ලද පුද්ගලයාගේ අනන්‍යතාව සගවා පැවතීම,

(ඊ) සමීප මිතුරන් සහ පවුලේ අය වැනි අවිධිමත් නාමික කොටස් හිමියන් සහ අධ්‍යක්ෂවරුන්,

උ) වත්කම් වල නෛතික හිමිකාරීත්වය සහ ප්‍රතිලාභී හිමිකාරීත්වය වෙන් කිරීමට ඉඩ සලසන භාරයන් සහ වැඩපිළිවෙලවල්, සහ

ඌ) නෛතික පුද්ගලයන් ස්ථාපනය කිරීමේදී, ගණකාධිකාරිවරුන්, නීතිඥයන්, නොතාරිස්වරුන්, භාර සහ සමාගම් සේවා සපයන්නන් වැනි වෘත්තීය අතරමැදියන් භාවිතා කිරීම.

---

[7] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි 19 වන රීතියට යොමු වන්න.

[8] ෂෙල් සමාගම් යනු, සැලකිය යුතු මෙහෙයුම් කටයුතු හෝ අදාළ වත්කම් යනාදියද රහිතව භෞතික පැවැත්මක්ද නොමැතිව සංස්ථාපිත සමාගමකි.

[9] නම් කරන ලද කොටස්කරුවකු ලෙස හැඳින්වනුයේ, සැබෑ හිමිකරු හෝ ප්‍රතිලාභී හිමිකරු වෙනුවෙන් කොටස් හිමිකාරිත්වය තබාගන්නා සමාගම් සාමාජිකයන්ට ය. ඔහු/ඇය කොටස් වල ලියාපදිංචි හිමිකරු වේ. නම් කරන ලද කොටස්කරු විසින් භාරකාර ගිවිසුමක් යටතේ කොටස් තබා ගනු ලැබේ.

**නෛතික පුද්ගලයකුගේ ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා ගැනීම පිළිබඳ සිද්ධි අධ්‍යයනය**

සීමාසහිත ABC සමාගම යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සීමිත වගකීමක් සහිත පුද්ගලික සමාගමකි. මෙම සමාගම ඉඩමක් මිලදී ගැනීම සඳහා නිශ්චල දේපළ වෙළඳාම් අනුයෝජිතයෙකු වෙත පැමිණෙන ලදී.

සීමාසහිත ABC සමාගමේ කොටස් වලින් 30% ක් A යන අය සතුව ඇති අතර ඉතිරි 70% සීමාසහිත XYZ සමාගම සතුව පවතී. තවදුරටත්, සි/ස ABC සමාගමෙහි කළමනාකරණ අධ්‍යක්ෂ S වන අය අතර අධ්‍යක්ෂක මණ්ඩලය ඔහුගේ බිරිඳ සහ ඔවුන්ගේ දරුවන් තිදෙනා ගෙන් සමන්විත වේ.

මෙම උදාහරණයේ දී නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි 17 වන රීතියට අනුකූලව නිශ්චල දේපළ වෙළඳාම් අනුයෝජිතයා විසින් සී /ස ABC සමාගම සම්බන්ධයෙන් පහත සඳහන් දෑ හඳුනා ගත යුතු වේ.

1. ගනුදෙනුකරුගේ ව්‍යාපාරයේ ස්වභාවය, එහි හිමිකාරීත්වය සහ පාලන ව්‍යුහය;

■ සි/ස ABC සමාගමෙහි හිමිකාරිත්වය -A (කොටස් වලින් 30%) සහ සීමාසහිත XYZ සමාගම (කොටස් වලින් 70%);

■ ආයතනයේ හිමිකාරීත්ව ව්‍යුහය - සීමාසහිත ABC සමාගම යනු පවුලේ සාමාජිකයින්ට අයත් ව්‍යාපාරයක් වන අතර පුද්ගලිකව වෙළඳාම් කරනු ලැබේ;

2. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරයන් විසින් නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින් හි 17 (ආ) රීතියට අනුව ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු වේ.

■ අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්, ඔවුන් සතුව ඇති (S යන අයගේ පවුල) සඵලදායී පාලනය හේතුවෙන් හඳුනා ගත යුතු ය.

3. නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින් හි 18 වන රීතියට අනුව ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනාගැනීම සහ අනන්‍යතාවය තහවුරු කර ගත යුතු වේ.

■ හිමිකාරීත්වයෙන් 10% කට වඩා ඇති බැවින්, A යන අය හඳුනා ගැනීම සහ අනන්‍යතාවය තහවුරු කිරීම සිදු කල යුතුය.

■ 70% කට වඩා කොටස් දරන සී/ස XYZ සමාගම පාලනයට සම්බන්ධ වන බැවින් එම සමාගමෙහි 10%ක් හෝ ඊට වඩා කොටස් ඍජුව හෝ වක්‍රව හිමිකාරිත්වය දරනු ලබන හෝ පාලනය කරනු ලබන සියලුම තැනැත්තන් හඳුනා ගත යුතු ය.

■ කෙසේ වෙතත්, මෙවැනි අවස්ථාවක දී, සමාගමේ කොටස් වලින් 10% ප්‍රමාණයක් සැපිරීමට ප්‍රමාණවත් තරම් කොටස් සංඛ්‍යාවක් XYZ සමාගම තුලින් යම් පුද්ගලයෙකු හට හිමිව තිබේදැයි තිරණය කිරීම පිණිස හෝ එවැනි පුද්ගලයෙකු නොමැති බවට තීරණය කල හැකි වන තෙක් නිශ්චල දේපල අනුයෝජිත විසින් තවදුරටත් පරීක්ෂාවන් සිදු කල යුතුය.

■ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාරය විසින් මෙම තොරතුරු ලබාගත් ආකාරය සහ තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර.

**V වන කොටස**

**ප්‍රතිලාභී හිමිකාරීත්ව තොරතුරු හඳුනා ගැනීම සහ තහවුරු කිරීම සඳහා ඔබ කල යුතු දේ මොනවාද?**

25. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින්, නෛතික පුද්ගලයින් සහ නෛතික වැඩපිළිවලවල් වනු ලබන ගනුදෙනුකරුවන් ගේ ප්‍රතිලාභී හිමිකරුවන් හඳුනා ගැනීම හා ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම පිණිස සාධාරණ ක්‍රියාමාර්ග ගැනීම සිදු කරයි.

26. ඒ අනුව ප්‍රතිලාභී හිමිකරු හඳුනා ගැනීම අනිවාර්ය වේ. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ගනුදෙනුකරුවකුගේ ප්‍රතිලාභී හිමිකරුවන් කවුරුන්ද යන වග ස්ථාපිත කර ගත් පසු, එක් එක් ප්‍රතිලාභී හිමිකරු සම්බන්ධයෙන් අවම වශයෙන් පහත සඳහන් තොරතුරු රැස් කර ගත යුතුය.

අ) සම්පූර්ණ නම;

ආ) ස්ථිර නේවාසික හෝ තැපැල් ලිපිනය;

ඇ) වෘත්තිය, සේවා යෝජකයාගේ නම, ව්‍යාපාරය හෝ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්;

ඈ) නිල වෘත්තීය හැඳුනුම්පත් අංකයක් හෝ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය වැනි ප්‍රතිලාභී හිමිකරුගේ ඡායාරූපයක් හෝ වෙනත් ඕනෑම හඳුනා ගැනීමේ ලේඛනයක්;

ඉ) උපන් දිනය;

(ඊ) ජාතිකත්වය;

උ) අරමුදල් වල මූලාශ්‍රය;

ඌ) ගනුදෙනුවේ අරමුණ;

එ) දුරකථන අංක (නේවාසික, කාර්යාලය හෝ ජංගම).

27. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ව්‍යාපාරික සම්බන්ධතාවයකට පිවිසීමට හෝ කලින් කල පැමිණෙන ගනුදෙනුකරුවකු[10] සමග ගනුදෙනුවක් සිදු කිරීමට පෙර හෝ පවත්නා අනන්‍යතාවය තහවුරු කරගැනීමට හැකිවන ආකාරයේ ලේඛන වල මුල් පිටපත් ලබා ගැනීම මගින් ප්‍රතිලාභ හිමිකරුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට සාධාරණ පියවර ගත යුතුය.

28. අදාළ තහවුරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන පියවරයන් නෛතික පුද්ගලයාගේ හෝ වැඩපිලිවලෙහි හිමිකාරත්ව හා පාලන ව්‍යුහයන්ගේ අවදානම හා සංකීර්ණත්වය සලකා බලා ඉහත තහවුරු කරගැනීම සඳහා පවතින පියවරයන් ක්‍රියාත්මක කල යුතුය.

**VI කොටස**

**අ) දේශපාලනික වශයෙන් අනාවරණය වූ පුද්ගලයින් (PEPs) වන ප්‍රතිලාභී හිමිකරුවන්**

[10] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්හි 13 වන රීතියට යොමු වන්න.

29. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර විසින් ප්‍රතිලාභී හිමිකරු දේශපාලනික වශයෙන් අනාවරණය වූ පුද්ගලයෙක්ද[11] යන්න නිර්ණය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එවැනි වූ ක්‍රියාවලියක් හරහා, කිසියම් ප්‍රතිලාභී හිමිකරුවෙකු දේශපාලනික වශයෙන් අනාවරණය වූ පුද්ගලයෙකු ලෙස හඳුනා ගතහොත් එම ප්‍රතිලාභී හිමිකරු කෙරෙහි ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති ප්‍රකාරව ඇති ප්‍රවර්ධිත නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ නියමයන් ක්‍රියාත්මක කළ යුතුය.

**ආ) වාර්තා තබා ගැනීමේ බැඳීම්**

30. පනතේ සහ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති[12] අනුව නියම කර ඇති ආකාරයට නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර ප්‍රතිලාභී හිමිකාරීත්වයට අදාළ හඳුනාගැනීමේ සහ තහවුරු කරගැනීමේ තොරතුරු වලට අදාළ ලේඛන පවත්වා ගත යුතුය.

**ඇ) වාර්තා කිරීමට ඇති බැඳීම්**

31. නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති මගින් අවශ්‍ය කෙරෙන ආකාරයට, ප්‍රතිලාභී හිමිකාරීත්වයට අදාළ තොරතුරු හඳුනා ගැනීම සහ තහවුරු කරගැනීම ඇතුළුව නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමට අදාළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම මගින් ගනුදෙනුකරු වෙත හෝඩුවාවක් ලැබෙන බවට සාධාරණ ලෙස විශ්වාස කළ හැකි අවස්ථාවකදී පනතේ 7 වන වගන්තිය[13] ප්‍රකාරව සැක කටයුතු ගනුදෙනු වාර්තාවක් හැකි ඉක්මනින් ඉදිරිපත් කල යුතුය.

**ඈ) සම්බාධක**

32. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සඳහා නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති යටතේ අවශ්‍ය කෙරෙන වන පරිදි ප්‍රතිලාභී හිමිකාරීත්වය සම්බන්ධ නිර්දේශයන් සමග අනුකූල වීමට අපොහොසත් වීම, පනතේ 2 (3) වගන්තිය උල්ලංඝණය කිරීමක් වන අතර එම පනතෙහි 19 වන වගන්තිය යටතේ ද දඬුවම් ලැබිය හැකිය.

---

[11] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන්හි 24 වන රීතියට යොමු වන්න.

[12] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන්හි 38 (1) වන රීතියට යොමු වන්න.

[13] නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතීන්හි 14 වන රීතියට යොමු වන්න.